ත්‍රෛමාසික මෙහෙවරක අන්තර්ජාල ප්‍රකාශය

දැක්ම

2024 ජූනි - අගෝස්තු කලාපය

ඡායාරූපය
යසින්ත ප්‍රදීප්මාල්
සංවර්ධන නිලධාරී

බන්දුල පෙනියාටත් ජීවත් වෙන්න ඉඩක් දෙන්න

සින්නක්කර ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන

දන්න දේ පුළුවන් තැනින් පටන් ගන්න

මේ අපේ මෙහෙවරයි

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

දන්න දේ පුළුවන් තැනින් පටන් ගන්න

වරකාපොල කොට්ඨාසයේ ව්‍යවසායකයින් අගය කිරීමටත් ඔවුන්ව ලෝකයට හඳුන්වා දීමටත් තවත් දිරිගැන්වීමටත් ඉදිරිපත් කරන මේ කතා මාලාවේ මෙවර ඉදිරිපත් කරන්නේ ඔහු පිළිබඳවයි. කාර්මීකරනයට නතු වූ ලෝකයක අවශ්‍යතා සාධනය කරන්නට නව නිපැයුම්කරුවන් බිහිවන්නේ කලාතුරකිනි. ඔහුත් ඉන් එක් අයෙකි. ඔහු අඹේපුස්ස නිව් එවරස්ට් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් හි අධිපති එන්. ටී. එම්. ඒ. ප්‍රියන්ත මහතායි. විප්ලවීය යන්ත්‍ර නිෂ්පාදනයේ ප්‍රමුඛයකු වන ඔහු කාලයේ නාලයට අද ලොවට ගැලපෙන වැඩ බිමට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර දහස් ගණනාවක නිෂ්පාදන කරුවෙකි.

නිව් එවරස්ට් එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්හි අධිපති එන්.ටී.එම්.ඒ. ප්‍රියන්ත මහතා

- ☑ ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මානය **2016**
- ☑ සබරගමුව පළාත් හොඳම ව්‍යවසායකයා **2016** රන් සම්මානය
- ☑ කුඩා පරිමාණ දිස්ත්‍රික් රන් සම්මානය **2016**
- ☑ සබරගමුව පළාත් හොඳම ව්‍යවසායකයා **2017** රන් සම්මානය
- ☑ සබරගමුව පළාත් හොඳම ව්‍යවසායකයා **2018** රිදී සම්මානය
- ☑ සබරගමු පළාත් ආධුනිකයින් පුහුණු කිරීමේ **2018** රන් සම්මානය
- ☑ සබරගමුව පළාත් හොඳම ව්‍යවසායකයා **2019** රන් සම්මානය
- ☑ මහා පරිමාණ දිස්ත්‍රික් විශිෂ්ඨතා සම්මානය **2019**
- ☑ ලක් රැකියා හරසර සම්මානය **2019**
- ☑ මහා පරිමාණ පළාත් **2020** රන් සම්මානය
- ☑ සමස්ත ලංකා සංස්කෘතික පරිසරය සුරැකීමේ පදනම මගින් මානවහිතවාදී කීර්ති ශ්‍රී දේශමාන්‍ය ජාතික සම්මානය
- ☑ කුඩා කර්මාන්ත පළාත් **2022** රන් සම්මානය
- ☑ සමස්ත ලංකා ලෝහ, ඩයි යන්ත්‍රෝපකරණ මෙවලම් ආශ්‍රිත කර්මාන්ත කුඩා කාණ්ඩය **2023** රිදී සම්මානය
- ☑ සබරගමුව පළාත් හොඳම ව්‍යවසායකයා **2020** රන් සම්මානය

මම රට දිනලා ඉවරයි. ඊළඟ ඉලක්කය ජාත්‍යන්තරය

ඔබේ ව්‍යාපාරය පිළිබඳව විස්තර කළොත්?

මගේ ව්‍යාපාරයේ ස්වභාවය තමයි යන්ත්‍ර නිෂ්පාදනය. සියලුම වර්ගයේ විප්ලවීය යන්ත්‍ර නිෂ්පාදනය කරනවා. දර, භූමිතෙල්, ඩීසල්, හුමාලයෙන් ක්‍රියාකාරී වෙන විප්ලවීය යන්ත්‍ර වගේම පපඩම්, නූඩ්ලස්, මුරුක්කු, බිම්මල්, කුළුබඩු නිෂ්පාදනයට අදාළ යන්ත්‍ර නිෂ්පාදනත් අපේ ආයතනයෙන් සිදු කෙරෙනවා.

ඔබ කොහොමද මේ ව්‍යාපාරය ආරම්භ කළේ?

මම මුලින්ම කළේ යන්ත්‍ර අලුත් වැඩියා කරන එක . පාසල් ගිහින් ඉවර වුණාට පස්සේ මම ටෙක්නිකල් එකේ විදුලි කාර්මික පාඨමාලාවක් කළා. ඊට පස්සේ පුද්ගලික ආයතනයක සුළු වැටුපකට කාලයක් වැඩ කළා. ඊට පස්සේ මම ඊට පස්සේ යෝගට් හදන්න පටන් ගත්තා. යෝගට් කඩවලට දාගන්න ඕනේ නිසා මගෙන් යෝගට් ගන්න කඩවල ශීතකරණ නොමිලේ අලුත් වැඩියා කරලා දුන්නා. ඒ නිසා මගෙන් යෝගට් ගන්න පුරුදු වුණා. යෝගට් සතියකට **1000** ක් වගේ අලෙවි වන මට්ටමට මගේ කුලුන් යෝගට් නිෂ්පාදන ව්‍යාපාරය ගෙනාවා.

යෝගට් නිෂපාදන ක්ෂේත්‍රයේ නම් දරපු සන්නාම සමග කොහොමද ඔබේ යෝගට් සන්නාමය තරග කළේ?

මට ඕනෑ වුණේ වෙළඳපොළ හදාගන්න. මගේ යෝගට් නිෂ්පාදන කඩවල්වලට දාලා මම ම සල්ලි දාලා සමහරුන්ව යවනවා කඩවල්වලට කුලුන් යෝගට් කියලා ඉල්ලලා ගන්න කියලා. වෙළෙන්දොත් කුලුන් යෝගට් වල විශේෂත්වයක් ඇති කියලා අනෙක් එන අයටත් කුලුන් හොඳයි කියලා අලෙවි කරන්න පටන් ගත්තා. එක සැරයක් කුලුන් යෝගට් නරක් වෙලා කියලා කඩෙකින් පණිවිඩයක් ආවා. ගිහින් බලන කොට යෝගට් එක නරක් වෙලා. ඊට පස්සේ එක්කෙනෙක්ව දම්මලා දානේකට කියලා අනිත් කඩවල්වලට දාපු යෝගට් ඔක්කොම එකතු කළා. ඒ වගේ දේවල් පවා කරන්න වුණා කුලුන් යෝගට් එක වෙළඳ පොළේ තියාගන්න.

යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනයට යොමු වුණේ කොහොමද?

මට යන්ත්‍ර පිළිබඳ තාක්ෂණික දැනුම තිබුණා. ඒ වෙන කොට මම වරකාපොල අවට තියෙන යන්ත්‍ර අලුත් වැඩියා කරනවා. ඒ වන විට තිබුණු මගේ යෝගට් ව්‍යාපාරයේ යන්ත්‍ර මම තනියම නිෂ්පාදනය කළේ. පොඩි කාලේ ඉඳන්ම මම සෙල්ලම් බඩුවල කෑලි ගලවලා ආපහු හදන්න කැමතියි. මට නිව් එවරස්ට් ආයතනය ආරම්භ කරන්න මුදල් තිබ්බේ නැහැ. ඉඩමයි ගෙදරයි රු.**7500** කට උකස් කරලා ඒ ලැබුණු මුදලින් තමයි ව්‍යාපාරය පටන් ගත්තේ. මුලින්ම හැදුවේ මඤ්ඤොක්කා කපන යන්ත්‍රයක්.

නිව් එවරස්ට් එන්ටර්ප්‍රයිසස් එදා සහ අද වෙනස කොහොමද?

මේ ව්‍යාපාරය ආරම්භ කළේ **2008** වසරේදී. එදා මාත් එක්ක වැඩ කළේ සේවකයෝ දෙන්නයි. අද තිස් දෙනෙක් වැඩ කරනවා . එදා ලාභය ඉතා පොඩි මුදලක්. අද බිලියන තුනකටත් වඩා වැඩි ලාභයක් උපයනවා.

ඔබට නිව් එවරස්ට් මේ දක්වා ගෙන එන්නට රාජ්‍ය ආයතනවලින් ලැබුණු සහයෝගය කොහොමද?

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ජාතික ඵලදායිතා කාර්යාලය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ව්‍යාපාරය දියුණු කරන්න මාව දිරිගන්වන්න වගේම කොරෝනා කාලයේ අපේ ව්‍යාපාරය පවත්වාගෙන යන්න හොඳ සහායෝගයක් ලැබුණා.

ප්‍රේටන්ට් බලපත්‍ර දෙකක් තියෙනවා

යන්ත්‍ර නිෂ්පාදනයේ තිබෙන ප්‍රධානම අභියෝග මොනවද?

මිනිස්සු හිතන්නේ ලංකාවේ හදන ඒවා බාලයි. පිට රට හදන යන්ත්‍ර තමයි ගුණාත්මක කියලා. එහෙම දෙයක් නෑ. ඉන්දියාවේ ගෙවල්වල පිල්වල තමයි මේ යන්ත්‍ර හදන්නේ. මිනිස්සුන්ගේ ඒ මානසිකත්වය අපි වෙනස් කරන්න ඕනෑ. යන්ත්‍ර නිෂ්පාදනයට තියෙන අමුද්‍රව්‍යවල මිල වැඩි වීම තමයි දැනට තියෙන ප්‍රධානම අභියෝගය. තරඟකාරිත්වය අපට ලොකු ගැටලුවක් නෙවෙයි. මොකද යන්ත්‍ර නිෂ්පාදන ආයතන ලංකාවේ සීමිත ප්‍රමාණයක් තියෙන්නේ. අපේ යන්ත්‍ර ගුණාත්මක මට්ටමින් ඉහළයි. මිළදී ගත්තට පස්සෙත් වගකීම , හොඳ නඩත්තු සේවාවක් වගේම අමතර කොටස් මිළදී ගැනීමේ හැකියාවක් නිසා අපට තරඟකාරිත්වය අභියෝගයක් නැහැ.

NEW EVEREST ENTERPRISES

විජලන යන්ත්‍රවල නොමිලේ නඩත්තු සේවයත්, අමතර කොටසුත් අපේ නිසා වෙළඳපොළේ තරඟයක් නෑ

අත්දැකීම් ඇති සාර්ථක ව්‍යවසායකයෙක් විදියට නව ව්‍යවසායකයෙකුට කියන්න කැමැති මොකක්ද?

තමන් කරන ව්‍යාපාරය මොකක්ද ඒ පිළිබඳ හොඳ පුහුණුවක් ලබා ගන්න. පටන් ගත්තු දෙයක් මග නතර කරන්නත් එපා. මුලදි මුදල් ,ශ්‍රමය වැය කරන්න වෙනවා. නොදන්න දේවල් කරන්න යන්නත් එපා. ඒ වගේම රැල්ලට කිසි දෙයක් කරන්න එපා. වෙනස් දෙයක් කරන්න. අනිත් අය කරන්නන් වාලේ කිසි දෙයක් කරන්න එපා. තව කෙනෙක් වාහනයක් ගත්තා කියලා අපි වාහනයක් ගන්න අවශ්‍ය නැහැනේ. තමන්ට අවශ්‍යතාවයක් තියෙනවනම් විතරක් වාහනයක් ගන්න. ඒ මම කිව්වේ උදාහරණයක්. ඒ වගේම අනිවාර්යෙන්ම කැපවීම උත්සාහය තියෙන්න ඕනෑ. ගෙවන හැම තත්ත්පරයක්ම සතුටින් මනස තියාගන්න.

ඔබ ගැනත් විස්තර ටිකක් කියමුද?

මගේ තාත්තා එන්. ටී. එම්. ඒ. මැන්ඩලිස් හාමි. අම්මා පී. ඒ. පියසීලි. පවුලේ දරුවෝ හය දෙනයි. සහෝදරයෝ හතරයි. එක සහෝදරියයි. පාසල් ගියේ අඹේපුස්ස මහා විද්‍යාලයට. මම විවාහකයි. බිරිඳ රේණුකා ප්‍රියදර්ශනී. ඇය ගෘහණියක්. මට දුවලා දෙන්නෙක් ඉන්නවා. ලොකු දුව APIIT එකේ පරිගණක මෘදුකාංග ඉංජිනේරු හදාරනවා. පොඩි දුව කෑගල්ල ශාන්ත ජෝෂප් බාලිකා විද්‍යාලයේ ඉගෙන ගන්නවා.

ඉදිරි බලාපොරොත්තු මොනවද?

විජලන යන්ත්‍ර අපනයනය කිරීම වැඩි කරන්න ඕනෑ. මට ප්‍රේටන් බලපත්‍ර දෙකක් තියෙනවා. තව අලුත් නිෂ්පාදන වෙළඳ පොළට ගේන්න උත්සාහ කරනවා. නිව් එවරස්ට් ව්‍යාපාරය මගේ දුවලා දෙන්නා ජාත්‍යයන්තර මට්ටමේ තරඟකාරිත්වයට ගෙන යාවී කියලා බලාපොරොත්තුවෙන් ඉන්නවා.

සටහන - චලානි හේරත්

බන්දුල පෙතියාටත් ජීවත් වෙන්න ඉඩක් දෙන්න.

බන්දුල පෙතියා, නම නම් අපූරුයි. ඒත් මේ කියන්න යන කතාව නම් දුක්මුසුයි. බන්දුල පෙතියාගේ මරණ වරෙන්තුව ලියවී මුලු ලෝකයෙන්ම සමුගෙන යන්නට සැරසෙයි. කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල කොට්ඨාසයේ ගලපිටමඩ ග්‍රාමයේ ගලපිටමඩ රබ්බිඩිගල සිට හපුගොඩ දක්වා ගලා බසින දොළපාරේ පමණක් අපට හමුවන ශ්‍රී ලංකාවට පමණක් ආවේණික බන්දුල පෙතියාගේ නම 2012 වසරේ රතු දත්ත පොතටද ඇතුළත් වී ඇත.

ගම්මාන කිහිපයක් පසුකරමින් කිලෝමීටර් පහළොවක් පමණ ගලා යන ඇල මාර්ගයේ බන්දුල පෙතියා රැඳී සිටින්නේ කිලෝමීටර් එක හමාරක පමණ ප්‍රමාණයකය. සෙමෙන් ගලා යන දියපහරත්, මඳ සෙවණත් අතර ඇති වැලිමඩ, කොළරොඩු, ගල් බොරලු, තිරිවාන සහිත පතුලක් ඇති දොළ පාරේ කුඹුක් කෙටල අනෙකුත් ජලජ පැලෑටි අතර මේ මත්ස්‍යයා වාසය කරයි.

බන්දුල පෙතියා අධි සංවේදී මත්ස්‍යයකි. ගම්වැසියන්ගේ ජනාවාස මැදින් ගලා යන මේ දොළ පාරේ ඇතැම් මිනිස් ක්‍රියාකාරකම් නිසා මේ මත්ස්‍යයාට සිදුවන ව්‍යසනය වැඩිය. මෙහි පෝෂක ප්‍රදේශය රබර් වත්තක් සහ කුඩා වන රොදකි. ක්‍රමයෙන් වනගහනය අඩු වන නිසා දොළ පාර හිඳෙන සම්භාවිතාව වැඩිය. අවට හෙල්මලු ක්‍රමයට ඇති කුඹුරු යායට යොදන රසායනික ද්‍රව්‍ය දොළ පාරට එකතු වුවහොත් ජලයේ රසායනික සංයුතිය වී බන්දුල පෙතියාගේ ජීවිතයට විල්ල වන තර්ජනය වැඩිය. මේ වන විට අවට රබර් ඉඩම් එළිපෙහෙළි කර විධිමත් ඉඩම් පරිසර රටාවකින් තොරව වගා කර ඇති කුරුදු වගාව නිසාත් පස සෝදා ඇල මාර්ගයට පැමිණීමෙන් මේ මත්ස්‍යයාගේ වාසස්ථාන දැන් අහිමිව ඇත.මේ හේතුවෙන් මීට කිහිපයකට පෙර දෙදහසකටත් අධිකව සිටි බන්දුල පෙතියා දැන් සියයකටත් වඩා අඩු ප්‍රමාණයකට සීඝ්‍රයෙන් වඳ වී යමින් සිටී. රාජ්‍ය ආයතනවල එකතුවත් පර්යේෂකයින්ගේ අසීමිත කැප කිරීමත් ගම්වාසීන්ගේ පරිත්‍යාගත් නිසා මේ බන්දුල පෙතියා යළි ජීවිතය ලබන්නට සුදානමින් සිටී. ඒ මත්ස්‍යයා දැනට ජීවත් වන දොළ යහපත මට්ටමින් දීර්ඝකාලීනව පවත්වාගෙන යාමට වැඩපිළිවලක් සකස් කරමින් සමාන ස්වාභාවික පරිසර පද්ධතියක තවත් මත්ස්‍යය ගහනයක් ස්ථාපිත කිරීමට ගන්නා උත්සහාය වේ.

මීට වසර තිහකට පමණ මිරිදිය මත්ස්‍යය සම්බන්ධයෙන් රටේ නිශ්චිත නීතියක් පැවතුණේ නැත. ඕනෑම අයකුට ඕනෑම ජලාශයකින් මත්ස්‍යයන් ලබා ගනිමින් සුරතල් මසුන් ලෙස ඇති කරන්නත් වාණිජ අරමුණින් මින් මැදුරු නඩත්තු කරමින් ආදායම් උපයන්නටත් ගැටලුවක් නොවිණි. බොහෝ අය දේශීය මත්ස්‍යයන් එකතු කරමින් විවිධ වාණිජ ව්‍යාපාරවල නියලුණි. රංජිත් බන්දුල නම් දරන අය එවැනි මත්ස්‍යය ව්‍යාපාරයේ නියලුණු අයෙකි. බන්දුල පෙතියා ලෙස නම් දරන්නට පෙර මේ මත්ස්‍යයා හැදුන්වුයේ ජයන්තියා යන නමිනි. රංජිත් බන්දුල දීර්ඝ කාලීනව මත්ස්‍ය ව්‍යාපාරයේ යෙදුණු බැවින් මේ ජයන්තියා නමින් හදුන්වන මත්ස්‍යයාගේ විශේෂත්වයක් දැක ඇත. ඉන්පසු රෝහන පෙතියාගොඩ යන අයට මේ මත්ස්‍යයා හදුන්වා දී ඇත. ඉන්පසු තායිලන්තයේ මත්ස්‍යය පර්යේෂණ ආයතනයකට මේ මත්ස්‍යයා යවා ඇති අතර එයින් අනාවරණය වී ඇත්තේ මේ මත්ස්‍යයා ලංකාවට පමණක් ආවේණික මත්ස්‍යය විශේෂයක් බවයි. බන්දුල හා පෙතියාගොඩ යන නම් එකතු කර ලොවක් හඳුනන බන්දුල පෙතියා බවට ජයන්තියා පත් වූයේ එලෙසය.

බන්දුල පෙතියා රැකගන්න කාගේත් සහාය ඕනෑ

පරිසර අමාත්‍යාංශය, පෙව විවිධත්ව ලේකම් කාර්යාලය, ස්වාභාවික සංරක්ෂණ අන්තර් ජාතික සංගමය (IUCN) සමඟින් ටොයෝටා පරිසර අරමුදල එක්ව මේ මත්ස්‍යයා වඳ වී යාමට නොදී රැක ගැනීම ජාතික යුතුකමක් සේ සලකා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. විවිධ ව්‍යාපෘති ද මේ වන විට ක්‍රියාවට නංවා ඇත. මේ වන විට ඒ ව්‍යාපෘති අඩපණ වී ඇත. බන්දුල පෙතියා රැක ගැනීමට ගම්මාන තුනක් එකතු කරගනිමින් ප්‍රජා මූල සමිතියක්ද පිහිටුවා ඇත. සියල්ලන්ම එක්ව මේ වන විට සීඝ්‍රයෙන් වඳ වී යන බන්දුල පෙතියා රැකගැනීමට දැඩි ප්‍රයත්නයක් දරයි.

ලෝකයේ කොතනවත් නැති තමන්ගේ ගමේ දොළ පාරේ පමණක් සිටින මත්ස්‍යය විශේෂය රැක ගැනීමට ගම්වැසියන් දරන්නේද අපමණ උත්සහායකි. ගොවීන් රසායනික පොහොර අවම කර කාබනික පොහොරවලට යොමු වී ඇත. දොළ පාරට මායිම් වූ ඉඩම් මත්ස්‍යය අභිජනනය කටයුතුවට ගම්වැසියන් පරිත්‍යාග කර ඇත. ශ්‍රී ලංකාවට පමණක් ආවේණික මේ බන්දුල පෙතියා මුලු ලෝකයෙන්ම සමුගෙන යන්නට නොදී යළි ජීවිතය ලබා දීම ජාතික යුතුකමක් ලෙස සලකා කටයුතු කිරීම අප කාගේත් වගකීමය.

සටහන - චලානි හේරත්

අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබල ගන්වා යහපත් ආර්ථිකයක් ඇති කිරීමේ ව්‍යාපෘතියට අදාළ මූලික සාකච්ඡාවක්

අස්වැසුම ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහනට සමගාමීව ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය මත වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා එක්ව අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබල ගැන්වීමේ නියමු ව්‍යාපෘතියට අදාළ මූලික වටයේ සාකච්ඡා 2024.06.18 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්විය. තෝරාගත් වසම් පහක පවුල් කිහිපයක් ඉලක්ක කර ගනිමින් ආරම්භ කිරීමට නියමිත මෙම ව්‍යාපෘතියේ ඉදිරි පියවරයන් පිළිබඳව මෙහිදී විධිදුරටත් සාකච්ඡා කළ අතර වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා, සහකාර අධ්‍යක්ෂතුමා(සැලසුම්), ආසියානු සංවර්ධන බැංකුවේ නිලධාරීන්, දිස්ත්‍රික් ජීවනෝපාය සැලසුම්කරු, වරකාපොල සමෘද්ධි මූලස්ථාන හා මහසංගම් කලමණාකරුවන්,ව්‍යාපෘති සම්බන්ධීකරණ කලමණාකරු, සමෘද්ධි බැංකු කලමණාකරුවන් මේ සඳහා සහභාගිවිය. අඩු ආදායමිලාභී පවුල් සවිබල ගන්වමින් ඔවුනට යහපත් ආර්ථිකයක් උදාකර දී දිළිඳුකම පිටු දැකීමට මෙම වැඩසටහන ඉවහල්වනු ඇත.

නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තාක්ෂණික දැනුම ලබාදීමේ එක් දින වැඩමුළුවක්

නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින ප්‍රජාව හා ව්‍යවසායකයින් 300ක් ඉලක්ක කර ගනිමින් , තාක්ෂණ නව්‍යකරණය, පිළිබඳ දැනුම ලබා දීම මූලික පරමාර්ථය පෙරදැරිව තාක්ෂණය අමාත්‍යාංශය හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව 2024. 07. 03 වන දින වැඩසටහන සංවිධානය කරන ලදී. තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මැතිතුමාගේ සංකල්පයකට අනුව තාක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වරකපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ හා ව්‍යවසාය සංවර්ධන අංශය සමඟ කාර්යාලයේ අනෙකුත් නිලධාරීගේ සහයෝගයෙන් මෙය දියත් කෙරිණි.මේ අවස්ථාව සඳහා දැදිගම ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදයකාන්ත ගුණතිලක මහතා, තාක්ෂණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්තුමා, වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුලු පිරිසක් සහභාගී වූ අතර ජාතික ප්‍රමිත ආයතනය, ICTA ආයතනය, කාර්මික සංවර්ධන මණ්ඩලය, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ව්‍යවසාය සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, ලංකා බැංකුව, මහජන බැංකුව විද්‍යා හා තාක්ෂණය අංශය මූලික දනුවත් කිරීමේ දේශන තුළින් සහභාගී වූ පිරිසට දැනුම ලබා දීම සිදු විය. GMP සහතික ලබා ගැනීම, අන්තර්ජාලය හරහා වෙළඳ පහසුකම් ලබා ගැනීම සිදු කරන ආකාරය වැනි තේමා පාඨයන් ඔස්සේ දේශන පැවැත් වීම සිදු වූ අතර පැමිණ සිටි පිරිසට මේ හරහා පුළුල් අවබෝධයක් ලබා ගැනීමට අවකාශය උදාවිය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී රුකියා වෙළඳ පොළක්

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සමඟ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව 2024.07.02 වන දින ,ප්‍රාදේශීය රුකියා පොල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. දේශීය හා විදේශීය රුකියා සපයන ආයතන, යාන්ත්‍රික ඉංජිනේරු බලකාය, හමුඔ, කාර්මික විද්‍යාලය ඇතුළු ආයතන රැසක් මේ සඳහා සහභාගී විය. රුකියා සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය වැනි සේවා රැසක් මෙහිදී ලබා දීම සිදු කෙරුණි. වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුලු මාණ්ඩලික නිලධාරීන්, මානව සම්පත් සංවර්ධන අංශයේ නිලධාරීන් හා කාර්යාලයේ අනෙකුත් නිලධාරීන්ගේ සහයෝගයෙන් සාර්ථකව නිම කිරීමට අවකාශය හිමිවිය.

ගියත් ඇය රේල්ලුවට ලොකු තනතුරක් ලැබී වරකාපොලට කළ සේවය මනිනු බැරී

රාජ්‍ය සේවාව ගරු ගාම්භීර සේවාවකි. සමාජයට සේවය සැලසිය හැකි සමාජ සේවාවකි. රාජ්‍ය සේවයට එකතු වන්නේ රටේ ජනතාවගෙන් අතලොස්සකි. ඇයත් ඒ අතරින් එක් අයෙකි. වසර හයක් පුරාවට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස කටයුතු කළ ඇය මහජනතාව වෙනුවෙන් සිය රාජකාර්ය මැනවින් ඉටු කළාය. සහකම්පනයෙන් යුතු සංවේදී හදවතක් ඇති ඇය අවස්ථානුකූලව සෘජු, ස්ථිර හා නිවැරදි තීරණ ගන්නට නොපසුබට වූවාය. තමන්ට ලද අභියෝග නොබියව භාර ගනිමින් රාජකාරියේ අල්ප මාත්‍රයකුදු අතපසුවීමකින් තොරව ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් සේවය නොපිරිහෙලා ඉටු කලාය. ඇය අස්වැල්ලේ රාළලාගේ චන්ද්‍රානි කෞෂල්‍යා බණ්ඩාර මහත්මියයි.

ඒ. ආර්. මුදියන්සේ මහතාට හා ජී . ආර් සෝමාවතී මහත්මියට දාව උපන් ඇය සහෝදර සහෝදරියන් සිව් දෙනකුගේ පවුලේ බාලම සහෝදරියයි. කෑ/ඔත්නාපිටිය කණිෂ්ඨ ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ ඇය පහ වසර ශිෂ්‍යත්වය සමත්ව තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය මහා විද්‍යාලයෙන් උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබිය. ඉන්පසු කැළණිය විශ්ව විද්‍යාලයෙන් දර්ශන විශේෂවේදී උපාධිය ලැබුවේ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් ලබමිනි.

ඉන්පසු කැළණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ බාහිර කතිකාචාර්යවරියක් ලෙසද විදුසර පුවත්පත්වල තර්කශාස්ත්‍රය පිළිබඳ පාඩම්වලට ලිපි ලියමින් දැනුම දූ දරුවන් සමග බෙදා හදා ගත්තාය. විවිධ දේශපාලන බලපෑම් මත රැකියා අවස්ථා කිහිපයක්ම අහිමි වී ගියත් ඇය නැවතත් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන්නේ රංවල මහානාග විද්‍යාලයේ ගුරුවරියක ලෙසිනි. ඉන්පසු කාර්මික හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ ඇගයීම් සහකාර ලෙස **2008-2013** වසරවල අම්පාර හාඩි තාක්ෂණික විද්‍යාලයේ සේවයට එකතු වන්නේ එල්. ටී. ටී. ඊ. ත්‍රස්ත ප්‍රහාර උග්‍රව පැවති වටපිටාවකය. ජීවිතයට අමතක නොවන අත්දැකීම් රාශියක් එකතු කරගනිමින් ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගයෙන් සමත්ව බස්නාහිර පළාතට අනුබද්ධව සේවය කර රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස කටයුතු කළාය. ඉන්පසු **2018** වසරේ සිට **2024** මේ දක්වා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස වරකාපොල කොට්ඨාසයේ ජනතාවහට නොපිරිහෙලා සිය සේවාව ලබා දුන්නාය. අද ඇය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක් ලෙස සිය රාජකාරිය අරඹා ඇත. අපි මෙලෙසින් ඇයගේ දිවිගමනට සුභාශිංසන එක්කරමු.



නව සහකාර ප්‍රාදේශීය ලේකම් ශෂිකා කෝරළගේ මහත්මිය වැඩ භාර ගනී

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අභිනව සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස ශෂිකා කෝරළගේ මහත්මිය පසු ගිය 15 වන දින සිට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ භාරගන්නා ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි තාක්ෂණ හා කළමනාකරණය පිළිබඳ විශේෂවේදී උපාධිධාරිනියක් වන ඇය International university of japan හී සිය පශ්චාත් උපාධිය සම්පූර්ණ කර ඇත. වර්ෂ 2015 ශ්‍රී ලංකා පරිපාලන සේවය හා එක් වූ ඇය මීට ප්‍රථම රත්නපුර පළාත් සභාවේ සහ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කර ඇති දක්ෂ පරිපාලකවරියකි.

වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා ඇතුලු සමස්ථ කාර්ය මණ්ඩලය සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය කාර්යාලයට උණුසුම්ව පිළිගත් අතර ප්‍රාණ අපි ඇයගේ ඉදිරි රාජකාරි කටයුතු සඳහා අපගේ සුභ පැතුම්ද එක් කරන්නෙමු.

දිනුම් කණුව

මනස සහ මොළය අතර හුදකලා වීමට..

අදුරගෙන කඹය

එක්තරා මිනිසෙක් ගමක් මැදින් ඇවිදයමින් සිටියදී ඇත් ගාලක් පසුකර ගියේය. ඔහුට සැනෙකින් යමක් කල්පනා විය. එයනම්, තමා පසුකර ආ ඇත් ගාලේ අලි ඇතුන් බැඳ සිටියේ කුඩා කඹ වලින් බවයි. ඔහු ව්‍යාකූලත්වයට පත්විය.

"මෙතරම් ශක්තිමත් අලි ඇතුන්, උන් බැඳ ඇති කුඩා කඹ වලින් මිදී පලා නොයන්නේ මන්දැයි" ඔහු තනිව කල්පනා කරන්නට විය.

ඔහුට තමගේ ව්‍යාකූලත්වයෙන් මිදීමට අවශ්‍ය විය. ඔහු නැවත ඇත්ගාල වෙත ගොස් එහි ප්‍රධාන ඇත් ගොව්වාට තම පැණය ඉදිරිපත් කලේය. ප්‍රධාන ඇත් ගොව්වා සිනාසෙමින් පිළිතුරුදුනි.

"මේ අලි ඇතුන් කුඩා කල අල්ලාගත් කාලේ සිට බැඳ තබන්නෙ මේ කඹ වලින්මයි. කුඩා කලදී උන්ට මේ කඹ වලින් බේරිලා පලායන්න බෑ. උන් වයසින් වැඩෙද්දී උන් විශ්වාශ කරන්න පටන්ගන්නව උන් බැඳල තියෙන කඹයෙන් උන්ට ගැලවිලා යන්න බෑ කියල. ඉතින් දැනුත් උන් ඒ කඹ කඩාගෙන පලායන්න උත්සාහ කරන්නේ නෑ. ඒ නිසා සාමාන්‍ය කාලවලදී අපි මේ කඹ වලින් තමයි මුන් බැඳල තියන්නෙ."

මිනිසා පුදුමයට පත් විය. මෙම ශක්තිමත් අලි ඇතුන්ට පහසුවෙන් කඹයෙන් ගැලවී යාහැකි නමුත් ඔවුන්ට එය කල නොහැකිබව විශ්වාස කළ නිසා ඔවුන් කොටු වී සිටියහ.

අලි ඇතුන් මෙන් මිනිසුන්ද පලක් නැති සීමාවන්ගෙන් බැඳී අතීත අසාර්ථකත්වයන් හෝ බිය නිසා ඔවුන්ගේ සිහින, ඔවුන්ගේ අරමුණු සහ ඔවුන්ගේ ආශාවන් අත්හරින බවත්, බොහෝ දෙනෙක් නිදහස් වීමට සහ සාර්ථක වීමට තමන්ට ශක්තියක් ඇති බව කිසි විටෙකත් නොදැන තමා පිළිබඳව අවිශ්වාසයෙන් ජීවත්වන බවත් කල්පනා වී, අලිගාලෙන් පිටවයන මිනිසාගේ මුවගට සිහින් සිනහවක් නැඟුනි.

යසින්ත ප්‍රදීප්මාල්
සංවර්ධන නිලධාරි

පූ කුණ්ඩලී

එකා මෙන් එක් සිත්ව වදා...

එකා මෙන් එක් සිත්ව වදා...
යුනි යේ suspended වුණි
එකා මෙන් නොව මෙහි
තැළුල් තෑමත් බොහෝ වුණි
computer යුගයෙන්
file system එකට යන
දැන දැගත් නිලයන් බොහෝ වුණි
innovation තලොන්
system අවුල් වෙනවා බොලන්
හඬුවේ දෙන වැඩ ටික කරන්
නාටහරි නඩේ යමු බොලන්
System change කරන්න
තනි අපිට බැහැ බොලන්...

නිසංසලා පතිරණ
අභ්‍යන්තර විගණන අංශය

පියං ඉරමඬල

කඳ දිරාට ඉවණ වයන තිවට වන තිවලුන්
තිරිං පිපුණ නැතිදාට නවතයිද උඹුබිරුඬි

තරු කැණිති ඔැරුනවා කඳ ඔළිය ඇතිදාට
නැතිදාට පලන්විද තරු කැණිති ඇපෑළාගැඔට

වයනු ඔැන ඉවණ නදින්
කඳ ඔළිය කයිවාරු
කඳ දිරාට ඉවණ වයන ගනාවී ගුන්තිලයන්
ගොලදෙනුන් ගුඹනකර කඳේ කයිවාරුවට
පිඳපණ තරු කැණිති ඇපාදි තිනැයන්වී ගෙවිදිනට

පිපියන් ගුර ඔඬල
පිපියන් ගුර ඔඬල
පුඩිවා දිරින්නට
අතුගා දිරින්නට
කඳෙදුන් පණ නළ ගැයුණ ගනාතික්ඛුණු තිවලුන්

ඊඹ් මාවත නාම එහෙමයි

රොබරෝසියා මල් කිනිති
මතින් හැඩවුණු මග දිගේ
සිත සුලඟින් සිහින් පොද වැසි
ඇද හැලෙන මේ කනිෂ්මේ
නෙතේ ඇදෙනා දසුන්
පෙලකින් ඉගිල යයි හිත
තනිකමේ
හුරු පුරුදු මතකයන් එක්කම
හා තඹම් රිඹ් මාවතේ
තර්ෂ්ටනයේ කොල්ලෝ
රිනක් සැදැවේ බස් නැවතුමේ
හාන ඔබවම් සිනහ නඟමින්
පීර් යයි මාවත දිගේ
ඝරඝවියේ දොරටුවෙන් නික්මී
පෙම්වතුන් හති හතිකයේ
එක කුඩයේ ගැලි වෙමින්
හෙමිහිට හා නඟා එයි මාවතේ

නුඟ ගහක් යට හෙවනක වී
තුන්මුල්ල මහ හරියේ
වාරු දී ඝරවියට හෙමිහිට
ඉහළ ගත්තෙමි කලු කුඩේ
හුරු පුරුදු මතකයන්
ගොන්නක වෙලි යයි මා
තනිකමේ
රිවිදෙනා නුඹේ නිකිනි
සිනහවෙන් පිරි යයි දෙඔවන්
මගේ
ඉදුණු කෙහෙ රිලි සිනාසෙන
මුත් සැදෑ සමයේ පිවිතේ
ඝුරතේ ඇවලී ඇත දවසක
ඇවිද ගිය හැටි පිනි පොදේ
අවි නැතත් අද අවේ මතකය
කොතත හරි ඇති මාවතේ
රිඹ් මාවත එදා වාගෙම නාම
එහෙමයි කොදුරියේ

අභානි නුවන්තිකා
ගිණුම් අංශය

ආදරණීය ගණකාධිකාරිතුමියනි,

හුරු පුරුදු සිනහවෙන් මුවග ලියකම් පෑව
ලෙංගතුම ඇමතුම හාදකම් ගෙන ආව
විසල් පන්නරය වී නිබඳව ලග රැදුන
නේක කුසුමන් අතර තඹරුවයි නුඹ ඉතින්....
නුඹ යනෙන මාවතම පැහැසරෙන් හැඩ වෙන්න
තබන හැම පියවරක සිනහා මල් ඉතිරෙන්න
හමුවෙනා කඩ ඉමක ජය ටැඹම හිමිවෙන්න
දීඝායු ලැබ ඉතින් දිවි මගේ වැජඹෙන්න
ආදරණීය ගණකාධිකාරිතුමියනි,
තෙවසරක අමිල මෙහෙවරකින් පසුව
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්
නික්මී
තවත් නවමු මාවතක කිරුලු පළඳින්නට
යනෙන ගමනට
ඔබට ගෙනෙමි
සෙනෙහසින් සුබ පැතුම්.....

අභානි නුවන්තිකා සමරකෝන්
ගිණුම් අංශය

අඳුරු සඳ ඔබ

පිබවෙන්න ලඟා නරම දැනෙන අව් ගිනි මඳිනුත්
ඉරා දැමිලි වලා කුඩේ මායිම යටින්
සුන්කෙස්යයි අතින් ගිලිදිය බර ගෙන හිනින්
ගෙවා සැනසුම ගණින් අඳුරු වඩියා පසින්

ගිය තන්නෙ වේල්ලුව අප්පච්චිගේ හේන්
මගේ වූ හිනට වැහි පොදක් වී නෙන් කරන්
මියෙන නක්සිලාවට හුස්ම් ඩිංගක් අරන්
පණ පිඹින්නට අඳුරුනුමන් මැසෙනංවෙන්

ගිලිදිය දෙනා හැටි අපට පින් බිඳක්ම් අය කරන්
විසිහතර පැය මදිවූ ඔබ වෙහෙසවෙන තරම්
රඹ කුකුළ අපේ මඟ කවු සඳුරු වැල් මතින්
මල් පිපෙනු දැනලා ද හිනයෙන්ඩන් ඉතින්

කියන්නෙමි ගුණ වරණ අම්මට උදානතම්
අස්න්නට බැරි තරම් රිදෙනු නෙක් ඇගෙ සිවන්
අකැප වූ ඉංගිරිසි අකුරු හඬ කර රවුම්
නංගිට කියා දෙමි මදුලෙ වැලිමන ලියන්

හිරු දෙයියො වඩින විට වුව දියුණු හිනැහෙමින්
ගුරුනුමන් ඇන්නිමයි මල් පිපුනෙ ඔබ නමින්
සඳුර විසිකර නැගිව චී පිපුන මල් මෙලන්
සාසලට දුවන් එමි ලඳ නිසා මඟ ඔබෙන්

ශෂිකා කෝරළගේ
සහකාර ප්‍රාදේශීය ලේකම්

නෙරළිය

ඉඩෝර හුළඟට වියලුණ
කරඟට බැඳි දැන්
ඉරිතලා ගිය දෙපා වැහැරි
මතු වූ රේ නඟා
දන්නා තරම්
රෑ වී
නිහඬව බර දරාවුන්
කර්කෂ මහ පොළව
දන්නා තරම්
හිඟුරු දී හඬ නඟා
වහින මහ අහෝරා වැස්ස
දන්නා තරම්
නොදනී කිසිවෙක්
විදී දුක් අඳෝනා
තුදින හොයම අස්වද්දන්නට
කඳ පෙරදියක්

දුෂානී මධුභාෂිනී
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
වරකාපොල

අප්පච්චි...

ගහේ ශක්තිය තිබේ විරිය
දහදියෙන් පිටමං කරා
මගේ හෙනෙට යන්න ඔහුගේ
හින ඔක්කොම කැප කරා
ආදරේ ගැන ප්‍රේමයක් ගැන
වචන කොපමණ ගැඳුවත්
අප්පච්චි ඔබ ගැන කියන්නට
බැරුව පන්හිඳ ගොලු වෙලා

චතුරි ආරියරත්න
පෙරටු කාර්යාලය

රාත්‍රිය බියකරුයි
ඇසිපිය ද නොසෙල්වෙයි
ඔබ එන්න හිමියනේ..
හනිකටගෙයි ඉන්න වට බයයි..
තුරු අතුනර හිදිමින්
එබිබී කරයි රැදුරු සපුවන්
ඔබ ඇයිද හිමියනේ...
තවමත් එන්න පමා ඔතරම්
දිගු රාත්‍රිය ද මෙතරම්
ගිය ගමන දුරද කෙතරම්
යන්නෙපා හිමියනේ තවදුර
හදවත පැලී මියැදේවි මං

හිරෝමි නිලනිකා
තුල්හිරිය වසම

හිතේ තරහට...
වචන පෙරලුවට...
එන්නේ නැහෑ...
ඇක්තටම...
තරහක් හිතට...
හැමදාම එකසේම...
ආදරෙයි...
මං....
ඔය හඳට

කල්පනී බණ්ඩාර
ප්‍රාදේශීය සභාව
වරකාපොල

කාව ගොත්තමෙන්..

පැතුම් මල් ගොනු සුවඳ කරවා
පිදෙනා මල් ගොමු ගණන්...
නුඩින් නුඩ ගෙන
පැණි උරා බොනි පැණි
කුරුලු රැල් වරු ගණන්
අහස නිසොල්මන් වී බලා ඇති
අවධි කරනුව සොමි සුරල්...
ඔබේ හද මා ගැබේ
මිහිදන් වී ඉනිං දැන් හුඟ දවස්....

දර්ශා පබෝධනී
සංවර්ධන අංශය

කළු සේරිය මනරම් තිත පුදන්නෙමු සෙනෙහෙන්

ශතයකවත් වටිනාකමක් නැති බිංදුවක වටිනාකමත් දශමයක් නොවටිනා දශම තිතක වටිනාකමත් දන්නේ ගණකාධිකාරවරයෙක්.. නොවටිනාකම් වටිනාකම් කරගනිමින් ඉලක්කම් අතර හර බැර සමපාත කරනවා සේම වෘත්තීය ජීවිතයත් පුද්ගලික ජීවිතයේත් වගකීම් ඉටු කරලමින් , නිතර සිනහාවෙන් අප කාටත් ලෙංගතු වූ ඇය වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තෙවසරක අමිල සේවයක් ඉටු කළ ගණකාධිකාරතුමියයි.

රත්නායක මුදියන්සේලාගේ දුෂ්මන්ති ජයසිංහ නම් ඇය කුරුණෑගල කොයිලේගොඩ ග්‍රාමයේ ග්‍රාම නිලධාරිවරයකු වූ ජයසිංහ මහතාට ත් ස්වර්ණා පද්මිණි මහත්මියගෙත් එකම දියණියයි. එක් වැඩිමහල් සහෝදරයකුට බාල සහෝදරිය යි. රජයේ නීතිඥ වමින්ද දිල්රුක්ෂ රූපසේන මහතාගේ ආදරණීය බිරිඳ වන ඇය පුතුන් තිදෙනෙකුට ආදරණීය මවකි. ඇය පාසල් අධ්‍යාපනය ලැබුවේ කුරුණෑගල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයෙනි. වාණිජ අංශයෙන් උසස්පෙළ හදාරා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඇතුළත්ව විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන උපාධිය සම්පූර්ණ කරන්නේ දෙවන පෙළ ඉහල සාමාර්ථයක් ලබමිනි.

ඉන්පසුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට ඇය පිවිසෙන්නේ **2008** දෙසැම්බර් **15** වන දින මධ්‍යම නුවර ගම්පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයට එක් වෙමිනි. එලෙස රාජ්‍ය සේවයට අත්පොත් තැබූ ඇය ගණකාධිකාරී සේවයේ දෙවන ස්ථානය ලෙස **2011** වසරේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එක් වූවාය. **2020** වසරේ දෙසැම්බර් **15** වන දින ගණකාධිකාරී සේවයේ පළමු ශ්‍රේණියේ උසස්වීම් ලැබූ ඇය දස වසරක් නිස්සේ රඹුක්කන කොට්ඨාසයේ ජනතාවට අනුපමේය සේවයක් එක් කරමින් **2021** වසරේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සේවයට එක් වූවාය.ඉන් පසු තෙවසරක සේවා කාලයකට පසුව අද අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කොළඹ මහාධිකරණයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස උසස් වීම් ලැබ ඇය අපෙන් මෙලෙස සමු ගත්තේ වරකාපොල කොට්ඨාසයේ ජනතාවට අනුපමේය සේවයක් ඉටු කරමිනි.

-සංස්කාරක-

මුදල් රෙගුලාසි,
නිල බලය
මනුෂ්‍යත්ව සමපාත කර්මයන්
දිවා රෑ පූරාවට
කැපවීම,
මහන්සිය
ඉවසීම් හුයක අමුණමින්
හොඳ හිය තෙවසරක
නුඹ පැ අමිල මෙහෙවරට
අවසරයි,

අහිසෙස් පුදන්නට...

- වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය -

දුම්මලදෙණිය සිංහල ළමා සමාජයේ දරුවන්ගේ තෝරා ගත්තාලද සිතුවම්...

පොඩ්ඩන්ගේ රෑ රමා

ආර්. සුවිකා
2 වසර

ඩී. ඩිල්ෂාණි
6 වසර

ඩී.ජී. හංසිකා දිල්රුක්ෂි
4 වසර

ඩී.රශ්මික ඩිල්ෂාන්
8 වසර

ඩී.යොමෙල් පෙර පාසල්

එස්.රික්සාලනී
5 වසර

එස්.කිර්නිතා
5 වසර

අයි.මිතුන් ජනිත්
3 වසර

කේ.මරියා
8 වසර

අයි.සිත්මි කෞෂල්‍යා
6 වසර

වී.යශෝධා

එම්. අර්ෂදා
5 වසර

වී.ශවිෂ්ත
6 ශ්‍රේණිය

ජී.එම්.තනූෂා ලක්ෂානි
8 වසර

ටී.කවිලාෂිනි
8 වසර

රනිදු
6 වසර

එස්.යෂාන්
1 වසර

ජී.එම්.තනූෂා ලක්ෂානි
8 වසර

කෙටි බැය

ඔබගේ කාර්යයන් සරල කර ගැනීම සඳහා

"උරුමය"

සින්නක්කර ගුඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන

මොකක්ද?

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි ජනතාවට කෘෂිකාර්මික හා නේවාසික අවශ්‍යතාවයන්ට ඉඩම් අවසරපත්‍ර, දීමනාපත්‍ර හා බලපත්‍ර මගින් ලබා දී ඇත. ලක්ෂ 20 ක් පමණ ජනතාවට විවිධ කාලවල යම් යම් කොන්දේසි මත ප්‍රධානය කර ඇති ජයභූමි, ස්වර්ණභූමි,ඉසුරුභූමි ආදි නම්වලින් හඳුන්වන මේ ඉඩම්වලට ජනතාවට තම කටයුතු පහසුවෙන් කරගෙන යාමට සින්නක්කර ඔප්පු ලබා දීම මේ වැඩසටහන යටතේ සිදු කෙරේ.

උරුමය සින්නක්කර ඔප්පුවක් ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන මොනවාද?

1 බලපත්‍රයක් නම්

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ (19/2) බලපත්‍රය
- ජාතික හැඳුනුම්පත සහ එහි ඡායා පිටපත්

2 දීමනාපත්‍රයක් නම්

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ (19/4) දීමනාපත්‍රය
- මාස තුනක් ඇතුළත ලබාගත් සම්පූර්ණ පත්තිරුවක්
- ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතඩඩඩ

උරුමය ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය සිදුවන්නේ කෙසේද?

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා බලපත්‍රකරුවන් හා දීමනාපත්‍රකරුවන්ගේ දත්ත රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය (ESLIMS) හරහා ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් පසු එය පළාත් කොමසාරිස් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කෙරේ. ඉන්පසු අනුමැතිය ලබා ගත් පසු සින්නක්කර ඔප්පු මුද්‍රණය කර ජනාධිපති අත්සනින් ඉදිරිපත් කෙරේ.

උරුමය වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පු ලබා නොදෙන ගුඩම්වලට අදාල ගැටලු

- ජීවිත භුක්ති අයිතිය මත පවතින අවස්ථා
- ඉඩම උකස් කර ඇති අවස්ථා
- අධිකරණ කටයුතු සිදුවන අවස්ථා
- වෙනත් අයෙකුට නිසි ක්‍රමවේදයෙන් බැහැරව පවරා ඇති අවස්ථා
- පසු උරුමකරු හෝ 111 වන උපලේඛනගත උරුමකරු හැර වෙනත් ඥාතීන් ද ඉඩමේ පදිංචිව සිටින අවස්ථා
- වෙනත් ආරවුල් පවතින අවස්ථා
- ඉඩම් හුවමාරු වීම් වැනි ලේඛනගත දෝෂ සහිත අවස්ථා
- වෙනයම් නීතියක් සමඟ ගැටෙන අවස්ථා

තොරතුරු ලබා ගත හැකි දුරකථන අංක

ක්ෂණික අංක - 1908

ජනාධිපති කාර්යාලයේ
උරුමය ජාතික මෙහෙයුම් කාර්යාලය - 0114354600 / 0114354601

ඔබටත් ප්‍රාණ ඉඩහසර....

වරකාපොල කොට්ඨාසයේ ඔබෙත් දරුවන්ගෙත් නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව ලබාදීමට අප සුදානම්.
ප්‍රාණ ත්‍රෛමාසික සඟරාවේ ලබන කලාපයට ඔබේ නිර්මාණ praanamagazine@gmail.com හෝ 0706368628 දුරකතන අංකයට Whatsapp කරන්න.
ඔබේ අදහස්, යෝජනා, ගැටළු ද අපට යොමු කරන්න..
මේ ඉඩහසර ඒ සඳහාමය.

-සංස්කාරක-

වරකාපොල සෞන්දර්යවේදීන් ඇගයීමක්...

වරකාපොල ප්‍රාදේශීය බල ප්‍රදේශයෙහි කලා කෞශල්‍ය සපිරි සෞන්දර්යවේදීන් අගයීම උදෙසා උපහාර උළෙල **2024** ජූලි මස **28** වන දින වරකාපොල දුම්මලදෙණිය Public House උත්සව ශාලාවේදී පැවැත්විණි. මෙම උපහාර වැඩසටහන විශාරද මියුරි ඇලන් මහත්මිය ගේ ජන්ම දිනය නිමිති කරගනිමින් ඇයගේ මුලිකත්වයෙන් පැවැති මේ උපහාර උත්සවය සඳහා වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව, ප්‍රවීණ සිනමාවේදී සෝමරත්න දිසානායක, ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංගීත්) සුදත් සමරසිංහ , හිටපු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අබේසිංහ, රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ එම්. ජී. පී බණ්ඩාර ඇතුලු පිරිස ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූ අතර ප්‍රදේශයේ කලාකරුවන් **12** දෙනෙකු සඳහා මෙම උපහාර පිරිනැමීම සිදු කෙරිණි.

සුබෝධ ආබාධිත පුනරුත්ථාපන ළමා නිවාසයට විශේෂ පරිත්‍යාගයක්...

විශේෂ අවශ්‍යතා සහිත දරුවෝ කියන්නේ තවත් කාගේහරි රැකවරණයක් ලැබිය යුතු පිරිසක්. මේ අය ඉන්නේ හරිම සතුටින්. ඒත් සමාජයට යන්න බැරි කාගේත් වපර ඇසට ලක් වන අහිංසක මනුෂ්‍යයින් කොටසක්. ඉතිං වරකාපොල කොට්ඨාසයේ මෙවැනි විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ හිසට සෙවණක් දෙන තවත් ස්ථානයක් තමයි අල්ගම තල්ගහදෙනියේ සුබෝධ ආබාධිත පුනරුත්ථාපන නිවාසය.

මෙහි විශේෂ අවශ්‍යතා සහිත පිරිමි දරුවන් **13** කි. ඔවුන් පසුවන්නේ විවිධ වයස්වල. තමන්ගේම කටුරුත් නැතිව හුදකලාව ජීවත් වෙන මේ හිත්වලට සතුටක් ගෙන එන්නේ ඒ අයට කෑම බීම, ඇඳුම් පැළඳුම් හා තැගි බෝග අරන් ඇවිත් වරුවක් එයාලත් එක්ක ගත කරලා යන්න එන අය නිසා.

අපි උදෙන්ම අවදිවෙලා කඩිමුඩියේ කුමක් හෝ රස්සාවකට ගිහින් ගොම්මන් අඳුරත් එක්ක ගෙදරට ගොඩ වෙන්නේ තමන් ආදරේ කරන අයගේ උණුසුම රැකවරණය ගෙදර තියෙනවා කියලා දන්න නිසා. ඊටත් වඩා උදේම ගෙදරින් පිටවෙලා යන තමන්ගේ ආදරණීයන් නැවත නිවසට එනකන් ගෙදර ඉන්න අය බලාගෙන ඉන්නේ බලාපෙරොත්තුවලින් පිරි සෙනෙහසින්. ඒත් මේ අයට ඒ වගේ බලාපොරොත්තුවක් වගේම ආදරයක්, සෙනෙහසක්, උණුසුමක් අහිමියි. ඒ අයට තියෙන්නේ කුසට වැටෙන රසවත් ආහාරයක්, ගතට වැටෙන ලස්සන ඇඳුමක් කනට වැටෙන මිහිරි වදනක් විතරයි. ඒත් කන කෑමක රසක් දැනෙන්නවත් ගතට වැටෙන ඇඳුමක ලස්සන බලන්නවත් කනට ඇහෙන වදනක මිහිරක් දැනෙන්වත් සමහර දරුවෝ වාසනාවන්ත නැහැ. ඒත් ඉතිං ඒ අය කෑම බීම,ඇඳුම් පැළඳුම් අරගෙන කවුරුහරි එනකන් බලාගෙන ඉන්නේ ආදරෙන්. මොකද හෙටක් ගැන බලාපොරොත්තුවක් නැති එයාලට තියෙන එකම සතුට ඒ විතරමයි.

ඒ අයව නිතරම බලන්න එන අය ඉන්නවා. ඒ අතරින් එක්කෙනෙක් තමයි ගයන්ත භාග්‍ය මහතා. ඔහු විදේශගත වෙලා හිටියත් මේ දරුවන් වෙනුවෙන් මුදලින් හා ද්‍රව්‍යවලින් නිතරම ආධාර ලබා දෙනවා. පසුගියදා මේ ආබාධිත නිවාසයේ වතුර ටැංකිය තබා ගැනීමට සිමෙන්ති ආධාරකයක් ලබා දුන්නා. පසුගියදා ඒ මහතාගේ ධන පරිත්‍යාගයෙන් මේ දරුවන්ට කෑම බීම මෙන්ම කොට්ට මෙට්ට පරිත්‍යාගයක් ද සිදු කෙරුණා.

සංහිඳියාවක මංසල - 2024

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික අංශය හා ජාතික ඒකාබද්ධතා නිලධාරී එක්ව අධිකරණ අමාත්‍යාංශයේ ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ මූල්‍ය ප්‍රතිපාදන මත, සංහිඳියාවක මංසල **2024**, වැඩසටහන කාර්යාලයේ නිලධාරීන්ගේද සහයෝගය ඇතිව **2024.08.22** දින කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත් විය.

ආගම්වාද, ජාතිවාද පසෙකලා එකට එක්ව ශ්‍රී ලාංකීය ජාතිය වශයෙන් ඉදිරියට ගමන් කිරීමේ වටිනාකම අවබෝධ කර ගැනීම වැඩසටහනේ මූලික පරමාර්ථය විය. එක් එක් ආගම්වලට ගරු කිරීමත්, සහයෝගයෙන් ජීවත් වීමත්, සියලු සංස්කෘතීන් අගය කිරීමත්, මානව දයාවට හිතැති අනාගත දරු පරපුරකට මග පෙන්වීමත් වැඩසටහන තුළින් අපේක්ෂා කෙරිණි.

ගරු ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ උපදෙස් හා මඟපෙන්වීම මත සංවිධානය වූ මෙම වැඩසටහන සඳහා සර්ව ආගමික පූජකවරුන්, ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු මාණ්ඩලික නිලධාරී, අනෙකුත් නිලධාරී,දෙමාපියන් හා දරු දැරියන් සහභාගී විය. දහම් පාසල් දරු දැරියන්ගේ විවිධ සංස්කෘතික අංගවලින් හැඩගැන්වුණු වැඩසටහන කාගෙත් නෙත්සිත් පැහැරගත් හෝරාවකින් අනතුරුව නිමාවට පත්විය.

පුන්හිඳක්ක මංසෝල - 2024

ජාතික සාහිත්‍යය කලා මහෝත්සවයට සමගාමීව වරකාපොල ප්‍රාදේශීය සාහිත්‍යය උළෙල ප්‍රාදේශීය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික අංශයේ සංවිධානයෙන් පසුගිය සැප්තැම්බර් 13 වැනිදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්විය. එහිදී ප්‍රධාන සාහිත්‍යය දේශනය නාට්‍ය රචක, ලේඛක, මාධ්‍යවේදී චාලක රණසූරිය මහතා විසින් පැවැත් වූ අතර සුසර , ශ්‍රීමාලි, සංඛ කලායතනවල සහ රංගධාර කලා කේන්ද්‍රයේ දූ දරුවන්ගේ අලංකාර සංස්කෘතික කලාංග රැසකින් ඒ මොහොත වර්ණවත් විය.

ගීත රචනා නිර්මාණ, කෙටිකතා, පද්‍ය රචනා, නිසඳැස්, සාහිත්‍ය විචාර, ජනගායනා අත් අකුරු, ළමා කතාන්දර නිර්මාණ හා සාහිත්‍යවිචාර තරග රැසකින් තරගකළ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් විවෘත හා පාසල් අංශවල ජයග්‍රාහිකයන්ට ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීම එහිදී සිදුකෙරුණි. එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් කේ. ජී. එස්. නිශාන්ත මහතා සහභාගි වූ අතර ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය, මාණ්ඩලික නිලධාරීන් අතුළු කාර්යාලීය නිලධාරීන්, මව්පියන් හා දූ දරුවන් රැසක් සහභාගි විය.

පුංචි පශු වෛද්‍යවරිය

උදේම නිදිමතේ ඇහැරලා එනවිට
පුංචි පයට පැගුනු හැකරුල්ලාව
දෙකට මැදින් කැඩී දගලනවා දැක්කාම
අනේ පුංචි නෙතගට ඉනූ කදුලු ගඟ...
එතනම වාඩිවෙලා හැලූ කදුලු කොපමණද
කිරි විදුරුවෙන් බිංදුව බිංදුව
බීමට හැලුවේ ඇයි නොතේරේ මට

දර මැස්ස උඩ හිටිය කුණකටු පැටියා
හෙමින් අරගෙන කැලයට විසිකලා
තාත්ති එක්ක තරහම තරහා
විසිකල නිසාද සර්ප පැටියා

පොල් හොරෙන් කන පුලුන් පූසිට
නැන්දා ගැහුවලු කෝටිටෙන් තරහට
හොරෙන් පොල් අරන් කවන්නෙ පූසිට
දෝණිමයි කරන්නේ
ඒක හරි විසදුම....

කොහෙන්ද මෙතරම් සත්ව කරුණාව
දෝණිට ආවේ අපටවත් නැතිකොට
රචනාව කියෙව්වම තේරුනේ දැන් මට...
වෙන්නේ පශු වෛද්‍යවරියක් ලොකුවුනාම මම..

-සත්‍ය කතාවක් ඇසුරෙණි-

ඉසිරා ඒකනායක
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර

ප්‍රාණ ත්‍රෛමාසික අන්තර්ජාල සඟරාව
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය
වරකාපොල
praanamagazine@gmail.com

උපදේශකත්වය
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රාදේශීය ලේකම්
රංගන සජීව
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය සහකාර ප්‍රාදේශීය ලේකම්
ශෂිකා කෝරළගේ

සංස්කාරක
චලානි ධිවන්ති හේරත් (සංවර්ධන නිලධාරී) 0776057275

සම්බන්ධීකරණ සහය
ධනේෂි ජයතිලක(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)
චතුරි ආරියරත්න(සංවර්ධන නිලධාරී)
නිසංසලා පතිරණ(සංවර්ධන නිලධාරී)
ශාන්ත පුෂ්පකුමාර (සංවර්ධන නිලධාරී)
අශෝක නුවන් කුමාර(සංවර්ධන නිලධාරී)

පරිගණක අක්ෂර හා පිටු සැකසුම
යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරී) 0712637846

සංවිධානය
මාධ්‍ය ඒකකය
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - වරකාපොල